| | | | | |
|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | ) 0112669192 , 0112675011<br>) 0112698507 , 0112694033<br>) 0112675449 , 0112675280 | | මගේ අංකය<br>எனது இல<br>My No. | )<br>) 01/SA/NA/03/2020<br>) |
| ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | ) 0112693866<br>) 0112693869<br>)0112692913 | | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | )<br>)<br>) |
| විද්‍යුත් තැපැල<br>மின்னஞ்சல் முகவரி<br>e-mail | )postmaster@health.gov.lk<br>)<br>) | සුවසිරිපාය<br>சுவசிரிபாய<br>SUWASIRIPAYA | දිනය<br>திகதி<br>Date | )<br>) 2021.04. 28<br>) |
| වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>website | ) www.health.gov.lk<br>)<br>) | | | |


# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

සියළුම පළාත් ලේකම්වරු

සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා ජාතික රෝහල

සියළුම රෝහල් අධ්‍යක්ෂවරු / වෛද්‍ය අධිකාරීවරු / සෞඛ්‍ය ආයතන ප්‍රධානීන්

**<u>කොවිඩ් - 19 තත්ත්වය මත හෙද නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු තාවකාලිකව කල් දැමීම</u>**

වර්තමානයේ කොවිඩ් 19 රෝගය වැළදීම නිසා අසාධ්‍ය තත්ත්වයට පත්වන රෝගීන් ප්‍රමාණය වර්ධනය වීමක් පෙන්නුම් කරන බැවින් ඉදිරියේ දී ඇති විය හැකි තත්ත්වය සලකා බලා කඩිනමින් රෝහල්වල පවතින දැඩි සත්කාර ඒකකවල ධාරිතාවය වැඩි කිරීමටත්, අළුතින් දැඩි සත්කාර ඒකක ඇති කිරීමටත්, එම ඒකක සඳහා අවශ්‍ය අවස්ථාවල දී කාර්ය මණ්ඩලය අනුයුක්ත කිරීමටත් අවශ්‍ය පියවර ගන්නා ලෙස, ගරු සෞඛ්‍ය අමාත්‍යතුමිය විසින් උපදෙස් හා නියෝග ලබා දී ඇත.

02. ඒ අනුව, හෙද කාර්ය මණ්ඩලය අනුයුක්ත කිරීමේ අවශ්‍යතාවය සලකා බලා 2021.04.06 දින සිට වාර්ෂික ස්ථානමාරු නියෝග ලැබ මේ දක්වා එම ස්ථානමාරු නියෝග ක්‍රියාත්මක වී නොමැති හෙද නිලධාරීන්ගේ ස්ථානමාරු සම්බන්ධයෙන් පහත සඳහන් ආකාරයට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

I. රෝහල් ප්‍රධානීන් විසින් විශේෂිත හේතු (ගර්භනී, ප්‍රසූත නිවාඩු පිට සිටින, විශේෂිත අසනීප තත්ත්වයන්ගෙන් පෙළෙන හෝ වෙනත් පිළිගත හැකි සාධාරණ හේතුවක්) සහිත හෙද නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු නියමිත පරිදි ක්‍රියාත්මක කිරීම.

II. අනෙකුත් හෙද නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු 2021.05.30 දක්වා තාවකාලිකව අත්හිටුවා 2021.06.01 දින සිට යලි ක්‍රියාත්මක කිරීම.

වෛද්‍ය අසේල ගුණවර්ධන<br>
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්<br>
සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

වෛද්‍ය අසේල ගුණවර්ධන<br>
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්<br>
සෞඛ්‍ය අමාත්‍යාංශය<br>
"සුවසිරිපාය"<br>
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත.<br>
කොළඹ 10.